**ග්රේෂන් බුද්ධික විජේසිංහ එ. ශ්‍රී ලංකා පොලිසිය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1476/2019 (2020.01.14 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාය්ර්ය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාය්ර්ය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවධර්න
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** ග්රේෂන් බුද්ධික විජේසිංහ
**නොතිසි ලත් පාශර්වය** නම් කල නිලධාරී, පොලිස් මූලස්ථානය, කොළඹ 01
පොලිස්පතිතුමාගේ මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පති,පොලිස් මූලස්ථානය කොළඹ 01
පොලිස් ස්ථානාධිපති , පිටකොටුව පොලිස් ස්ථානය කොළඹ

**පෙනීසිටීම**
අභියාචක - ග්රේෂන් බුද්ධික විජේසිංහ
පොදු අධිකාරිය - ඒ. ජී. බී. පුෂ්පකුමාර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.02.28 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - නැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.03.22 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.04.27 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.02.28 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*1.*

*a) "2013.12.09 දිනැති GCIB (1) 201/154 පැමිණිල්ල*

*b) මෙම පැමිණිල්ලට අදාළ සාක්ෂිකරුවන්ගේ /වග උත්තරකරුවන්ගේ ප්‍රකාශ*
*I) 2013.12.09 GCIB 211/162*
*II) 2013.12.10 GCIB 226/176*
*III) 2013.12.10 GCIB 228/177*
*IV) 2013.12.10 GCIB 329/265*
*V) 2013.12.20 GCIB 56/354*

*c) මෙම පැමිණිල්ලට අදාළ පොලිසිය විසින් අදින ලද සිතියම්, සටහන් හා විභාග/සමථ සටහන්*

*2.*
*a) 2013.12.06 දිනැති MCIB (1) 55/44 පැමිණිල්ල*
*b) මෙම පැමිණිල්ලට අදාළ සාක්ෂිකරුවන්ගේ/වග උත්තරකරුවන්ගේ ප්‍රකාශ*
*c) මෙම පැමිණිල්ලට අදාළ පොලිසිය විසින් අදින ලද සිතියම්,සටහන් හා විභාග /සමථ සටහන්*

*3. 2013.10.26 දිනැති MCIB (1) 58/202 පැමිණිල්ල අදාළ පොලිසිය විසින් අදින ලද සිතියම්, සටහන් HAAA විභාග /සමථ සටහන්"*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.03.22 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.04.27 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත 2019.12.23 දිනැති ලිඛිත ප්‍රකාශ අභියාචක හටත් පිටපත් සහිතව ඉදිරිපත් කර ඇති අතර එහි පහත ලිඛිත ප්‍රකාශ කොමිෂන් සභාවේ අවධානයට යොමු විය.

> *"5. ඉහත ග්‍රේෂන් බුද්ධික විජේසිංහ පාශර්වකරුවකු වන කොලබ දිසා අධිකරණයේ අංක 01 උසාවියේ DSP/171/2014 දරන නඩුව පවතින බව මොහු සම්බන්ධව කරන විමශර්න වලදී අනාවරණය වී ඇත.*
> *6. පොලිසිය වෙත කරන පැමිනිල්ලක හෝ ප්‍රකාශයක හෝ තොරතුරු එයට අදාළ සිවිල් නඩුවක පාශර්වකරුවෙකු විසින් ලබාගැනීමේදී එම පාශර්වකරු විසින් ඔහුගේ නීතිඥයාගේ මාගර්යෙන් දිසා අධිකරණයේ නියෝගයෙන් ලබාගත යුතු බවට යසපාලට එරෙහිව මුණසිංහ (68 න.නි.වා. 383) නඩුවේ දී සිරිමාන්න විනිසුරු තුමා පිළිගෙන ඇත. මෙම අභියාචක ග්‍රේෂන් බුද්ධික විජේසිංහ මහතා විසින් එවැනි අධිකරණ නියෝගයක් ලබාගෙන නැත.*
> *7. ඉහත අංක DSP/171/2014 දරන නඩුව දැනට විභාග වෙමින් පවතින හෙයින් අභියාචකය විසින් අපේක්ෂිත තොරතුරු ලබාදීම තුලින් පැමිණිලි පාශර්වය හා අනෙකුත් පාශර්වයන්ට යම් අගතියක් වියහැකි බැවින් ද, අභියාචක විසින් අධිකරණ නියෝගයක් ලබාගෙන ඉදිරිපත් කර නොමැති බැවින් ද අභියාචනා පත්‍රයේ අනු අංක 16 ඇතුලත් තොරතුරු ලබා දී නැත."*

අභියාචනා විභාගය අවස්ථාවේදී පොදු අධිකාරිය විසින් දක්වා සිටියේ සිවිල් නඩු දෙකක්,එනම්, කොළඹ දිසා අධිකරණය DSP/171/2014 හා DSP/32/2014 දැනට විභාග වෙමින් පවතින බැවින් අභියචක විසින් ඉල්ලුම් කල ඇති තොරතුරු ලබා දිය නොහැකි බවය.

කෙසේ වෙතත්, 675/2018 දරන තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ අභියාචනයේ 03.12.2019 දිනැති නියෝගයෙන් අදාල තොරතුරු ලබා දුන් බවත්, තමා මෙම අවස්ථාවේ ඉල්ලුම් කරන තොරතුරු ද, එහිම කොටසක් බැවින්, තොරතුරු ලබා දිම ප්‍රතික්ෂේප කල නොහැකි බව අභියාචකයාගේ තකර්ය විය.

මෙහිදී අදාළ සිවිල් නඩුව ඍජුවම මෙම කරුණ හා සම්බන්ධ වේ ද යන්න කොමිෂන් සභාව විසින් විමසා සිටින ලදී. එහි දී පොදු අධිකාරිය මගින් පවසා සිටියේ කොළඹ පරම විඥනාථර් බෞද්ධ සමිතිය විසින් අභියාචකට එරෙහිව ගොනු කල ඇති පැමිණිලි 16ක් මුල් කොටගෙන ඉහත සිවිල් නඩුව ගොනු කල ඇති බවයි.

**නියෝගය:**

පොදු අධිකාරිය විසින් තොරතුරු දැන ගැනීමේ පනතේ 5 වන වගන්තියට අනුව තොරතුරු ප්‍රතික්ෂේප කිරීම හෝ තොරතුරු නිදහස් නොකිරීම සඳහා කිසිදු හේතුවක් සඳහන් කර නොතිබූ බැවින් පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනයේ පවතින ඉල්ලා සිටින තොරතුරුවලට, පුරවැසියෙකුගේ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි වන්නේ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) වගන්තියේ සඳහන් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් සඳහන් කිරීම මගින් පමණක් බව අවධාරණය කරනු ලැබේ.

ඉහත සඳහන් කල සිවිල් නඩුව හා අභියාචක විසින් ඉල්ලුම් කල තොරතුරු**වලට** ඍජුව සම්බන්ධ වන්නේද යන්න සොයා බලා පෙන්නුම් කරන ලෙස පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ. එමෙන්ම අභියාචක වෙත සති දෙකක් ඇතුලත ලිඛිත ප්‍රකශ කොමිෂන් සභාව වෙත ගොනු කරන ලෙස නියෝග කරනු ලැබේ. ඒ අනුව අභියාචනය 2020 අප්‍රේල් මස 28 ට කල් තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කායර්ය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාශර්වය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
****

.............................................................
මහින්ද ගම්මම්පිල - සභාපති

.............................................................
කිෂාලි පින්ටෝ-ජයවධර්න - කොමිෂන් සභා සාමාජිකා

.............................................................
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

.............................................................
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා
****